**අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව**

**මාතලේ දිස්ත්‍රික්කය**

**-------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා  මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 21 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 08 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 අගෝස්තු 27 දින  සභාවේ  සභාපතිවරයා  වෙත යවන ලදි.

1.2 මතය

--------

සභාපතිවරයා වෙත යවන ලදි මාගේ වාර්තවේ1.3 ඡේදයේ  දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාවේ  මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත්  ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ  ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ  අඩුපාඩු  විගණනයේදී නිරීක්ෂණය විය.

(අ). සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට  රෙපයාරින් සොකට් 99ක් වූ තොග ශේෂයේ වටිනාකම ගිණුම්වල පෙන්වා  නොතිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). ලැබිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 03ක වටිනාකම රු.5,348,460ක් වූ අතර ඊට වර්ෂ 1ත් 5ත් අතර කාලයට අයත් රු.3,541,974ක ශේෂ ඇතුළත් වී තිබුණි.

(ආ). ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ණයහිමි ශේෂවල එකතුව රු.3,193,721ක් වූ අතර, එම ශේෂ වලට වර්ෂ 02ත් වර්ෂ 05ත් අතර කාලයට අයත් රු.175,952ක ශේෂ ඇතුළත්ව තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.15,867,029ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි සහ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ). | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| | (i). 19(i)(i) වගන්තිය | පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය කලින් ලබා නොගෙන සේවකයින් දෙදෙනෙකු සේවයේ යොදවා ඔවුන්ට වැටුප් හා දීමනා වශයෙන් රු.99,184ක් ගෙවා තිබුණි. |
| | (ii). 132(ඒ) වගන්තිය | අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන අවස්ථා 03කදී රු.61,650ක වියදම් දරා තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.761,497ක්වූ අතර, ඊට එරෙහිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.722,572ක් විය. ඉකුත් වර්ෂය සමග

සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 1,484,069 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 අක්කර බදු සහ ජල ගාස්තු
------------------------------

හිඟහිටි අක්කර බදු සහ ජල ගාස්තු පිළිවෙලින් රු.52,472ක් හා රු.170,570ක් විය.

2.2.2 බදු කුලී
---------

ප්‍රාදේශීය සභා පනතේ 19(xii) වගන්තිය ප්‍රකාරව අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන ගුරුබැබිල කඩකාමර 02ක් සහ පුස්සැල්ල කඩකාමරයක් වසර 05ක කාලයක් සඳහා බදු දී තිබුණි. ගුරුබැබිල කඩ කාමර ඉදිකර වර්ෂ 05ක කාලයක් ගතවී තිබුණු නමුත්, එදින සිට එක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එක් කඩ කාමරයක් බදුදී නොතිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------

පළාත් සභවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.305,552 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.423,154ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගන්තිය ප්‍රකාරව අනුමත සැලසුම් මත ඉදිකෙරෙන ගොඩනැගිලි වෙනුවෙන්, සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ තුන තුළ ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 68කින් 42ක් අනුමත කර තිබුණු නමුත් අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ අයදුම්පත් 02ක් සඳහා පමණි.

(ආ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට අඛණ්ඩව දායක මුදල් නොයැවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් වල එකතුව රු.819,896 ක් විය.

(ඇ). සභා ගොඩනැගිල්ල හා ආශ්‍රිත ඉදිකිරීම් සඳහා රු.4,962,026ක වියදම් දරා තිබුණු නමුත් එම භූමිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ). වර්ෂ 06 ක කාලයක් ගතවී ඇති රු.188,710ක පෙර ගෙවුම් ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 නිශ්ක්‍රීය වත්කම්

--------------------

සභාව සතු අත්ට්‍රැක්ටරයක්, යතුරු පැදි දෙකක් හා ටිපර් රථයක් නිශ්කාර්යව සභා භූමියේ ගාල්කර තිබුණි.

3.3 හදුනාගත් අලාභ

--------------------

සභාව සතු කඩකාමරයක් වෙනුවෙන් ඉකුත් කාලපරිච්ඡේදයන් සඳහා නියමිත පරිදි කුලී මුදල් අයකර නොගැනීම හේතුවෙන් සභාවට රු.17,000ක අලාභයක් සිදුවී තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

| කර්මාන්තයේ නම | ඇස්තමේන්තු මුදල හා ප්‍රතිපාදන ප්‍රභවය | පරික්ෂා කළ දිනය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i).කුඹල්ඔළුව කොළඹුවත්ත අස්වැද්දුමේ කොටසේ පටු පාලම ඉදිකිරීම. | රු.293,912 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 2014 මාර්තු 13 | (i) පාලමේ කලුගල් බැම්ම වෙනුවෙන් ඝන මීටර් 10.08ක් සඳහා රු.88,355ක් වැය කර තිබුණද,කලුගල් ප්‍රමිතියෙන් තොර ඒවා විය.<br>(ii) වර්ග මීටර් 8.5ක් සිමෙන්ති වැලි මිශ්‍රනයෙන් කපාරාරු කර වැඩ විෂයය නිමකර නොතිබුණි.<br>(iii)බැමි අසළ පිරවීම සඳහා පස් කැපීම හා ප්‍රවාහනය වෙනුවෙන් රු.15,324ක් ගෙවා තිබුණද, එම වැඩ විෂයය ඉටුකර නොතිබුණි. |
| (ii).ඇලගල අක්කර08 පාර ප්‍රතිසංස්කරණය කිරීම. | රු.291,227 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | - එම - | (i) අඟල්4 ඝනකමට කොන්ක්‍රීට් මිශ්‍රනය යෙදිය යුතු වුවද මාර්ග තලය ස්ථාන 2කින් කඩා පරීක්ෂා කිරීමේදී එහි මධ්‍යනය ඝනකම අඟල් 2.875ක් බව නිරීක්ෂනය විය. |

(ii) මාර්ගයේ දිග මීටර් 82ක්ද,පළල මීටර් 2.5 ක් වු අතර ඝනකම මීටර් 0.073ක් වූ හෙයින් මුළු ඝන මීටර් 5.55ක් සඳහා රු.68,175ක් වැඩිපුර ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

4.1 අයවැය පාලනය
--------------------

ආදායම් විෂයන්9ක ඇස්තමේන්තුගත රු.152,000ක ආදායම් වලින් කිසිදු මුදලක් උපයාගෙන නොතිබුණු අතර ආදායම් විෂයන්15ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 27 සිට සියයට 95 අතර පරාසයක විචලනයක් පැවතුණි. වැය විෂයන් 22කට අදාළ ශුද්ධ ප්‍රතිපාදනය සහ වියදම අතර සියයට 19 සිට සියයට 96 දක්වා පරාසයක විචලනයක්ද පැවති අතර වැය විෂයන් 04 ක ඇස්තමේන්තුගත සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. ඒ අනුව ආදායම් හා වියදම් පාලනයේදි අයවැය ලේඛණය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොලත් විගණන විමසුම්
---------------------------------------------------------

සභාව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් වලින් 11 කට පිළිතුරු සපයා නොතිබුණු අතර, එකී විමසුම් වලට භාජනය වු ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.17,868,587ක් විය.

5. පද්ධති හා පාලන
---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ). හිඟ ආදායම් අයකර ගැනීම.
(ආ). අයවැය පාලනය.
(ඇ). අභ්‍යන්තර පාලනය.
(ඈ). ණයගැති හා ණයහිමි පාලනය.
(ඉ). වත්කම් කළමනාකරණය.
(ඊ). මූල්‍ය පාලනය.